# අලුබෝමුල්ලේ වීතිය සාංවත්සරික ගොවි කර්මාන්ත හා හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය.

# The Second Annual Agricultural Industrial Show at Alubomulla.

අළුබෝමුල්ලද, පමුණුගම සහ ඉඹුල්ඉහද: මහබෙල්ලන සහ උරකඩුවද යන ස්ථානවල පිහිටි සමූපකාර සමිති තුනෙන් මෙහෙයන ලදුව යථොක්ත ප්‍රදර්ශනය පසුගිය මාර්තුමස 9වෙනි දින අළුබෝමුල්ලේ පිරිමි පාඨශාලාවේදී පවත්වනු ලැබීය. කළුතර සහකාර දිසාපතිතුමා විසින් ප්‍රදර්ශනය විවෘතකරණලදී. මීට ඉහතින් පවත්වනලද ප්‍රදර්ශනයට වඩා මේ ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශන ද්‍රව්‍යයන් 324ක් පත්කරණලදී.

දකුණු කොට්ඨාශයේ කෘෂිකර්මික නිලධාරි මහතා පැමිණ සිටියේය දකුණු කොට්ඨාශයේ පැලරෝග පිළිබඳ ඉන්ස්පැක්ටර් මහතා විසින් උප ඉන්ස්පැක්ටර් මහතා භාරයේ මේ පළාත්වල බෝවෙන පැලරෝග පිළිබඳ ප්‍රදර්ශනයක් ඉදිරිපත් කර තිබුණේය. බන්ඩාරගම කෘෂිකර්මෝපදෙශක මහතා විනිශ්චයකාරයා හැටියට ක්‍රියාකරමින් ප්‍රදර්ශන ද්‍රව්‍යයන් පිළියෙල කිරීමට ආධාරවිය. මීට පෙර පවත්වනලද ප්‍රදර්ශනවලට අනුව මේ ප්‍රදර්ශනයේත් කටයුතු සංවිධාන කරනලද්දේය. ඒ සඳහා ඒ. ඇම්. ක්ලැමන්ට් ඩාස් මහතාට හා කෘත්‍යාධිකාරි මණ්ඩලයටද පැසසිය යුතුයි. මේ ප්‍රදර්ශනයට විශාල පිරිසක් පැමිණ සිටියාය ප්‍රදර්ශනයේ කටයුතු සඵලවූ බැව් පැමිණසිටි සියලුදෙනාගේම අදහසයි. ප්‍රදර්ශ ද්‍රව්‍යයන්ගේ මුළුගණන 693කි. මේ ප්‍රදර්ශනයට අයත් ප්‍රදෙශයන්හි පදිංචි ගොවීන්ට ප්‍රදර්ශනය වෙනුවෙන් වවනලද ඔවුන්ගේ ඉඩම් කට්ටිවලට දැමීම සඳහා ඒ මේ ජ්‍යෙෂ්ඨමේදී රටපෝර කොන්ඩර 118ක් විකුණනලදී.

එළවළු කොට්ඨාශය ප්‍රමුඛස්ථානය ඉසිලීය. ගිය අවුරුද්දේ ප්‍රදර්ශනයට තබන ලද එළවළු වර්ගවලින් විශේෂයෙන් පතෝලා, තියඹරා පිපිඤ්ඤා, වම්බොටු සහ බන්ඩක්කාවල දියුණුවක් දකින්ට ලැබුණි. ප්‍රදර්ශනයට තබනලද අනික් එළවළු වර්ග මිරිස්, වැටකොලු, තිබ්බටු, රාබු, අලවර්ග සහ පෝච්චිවල වවනු ලබන නොයෙක් පලා වර්ගදවෙත්. පිටරටින් ගෙන්වනලද අළුත් එළවළු වර්ග කීපයක්ද දකින්ට ලැබුණේය. මේ වර්ගවල ඇට ක්ලැමන්ට් ඩයස් මහතා විසින් බෙදාදෙනලදී. පළමුවන කොට්ඨාශයේ අන්නාසි හා පැපොල්වල සැලකිය යුතු දියුණුවක් පෙනී ගියේය මුළුවශයෙන් කල්පනාකර බලනවිට ප්‍රදර්ශනය සඵලවූ බැව් කිය යුතුයි. දෙසි වර්ගවල දියුණුවක් නැත. වී වර්ගවල ගිය අවුරුද්දට වඩා සැලකිය යුතු දියුණුවක් තිබුණ නමුත් තවම සම්පූර්ණ දියුණුවක් වීනැත.

ප්‍රදර්ශනයට තබනලද අන්‍ය ද්‍රව්‍යයන් අතර, කිරි සැම්පල්ද, අඹකොස් විශාල තොගයක්ද, බුලත් සහ පුවක්ද, පොල්වලු සහ තරමක් හොඳ ගම්බද රබර්දවූහ. ඉතා වැදගත් ප්‍රදර්ශිතයක්වූ මෙරට වවනලද නේපියර් වර්ගයේ තණකොළ ක්ලැමැන්ට් ඩයස් මහතා විසින් පිළිවෙලකට තබා තිබුණේය. මේවා වවන අන්දමද පෙන්නුම්කර තිබුණේය.

හස්ත කර්මාන්ත පිළිබඳ කොට්ඨාශයේ පැසසිය යුතු ප්‍රදර්ශිතයෝ කීපයක්වූහ එනම් : පුටු, පැදුරු, හැළි වළන්, බන්ඩක්කා කෙඳිවලින් සාදනලද විනේල, ගම්බද පාඨශාලාවල චිත්‍රකර්ම සහ ගෙවතුවල වවන එළවළු වර්ගද වෙත්.